www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප/සසජාශි කොලඹ රැස්වීම
# දෙවන ලෝක යුද්ධයෙන් හැත්තෑ වසරකට පසු: පාඩම් සහ අන්තරායන්

## SEP/ISSE meeting in Colombo
## Seventy years since World war II: lessons and warnings

2009 නොවැම්බර් 05

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජවාදී සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) " දෙවන ලෝක යුද්ධයෙන් හැත්තෑ වසරකට පසු: පාඩම් සහ අන්තරායන්" මැයෙන් කොලඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේ දී නොවැම්බර් 10 දින රැස්වීමක් පවත්වනු ලබයි.

දෙවන ලෝක යුද්ධය ප්‍රජාතන්ත්‍රවාදය සහ ෆැසිස්ට්වාදය අතර අරගලයක් නොව; පලමුවන ලෝක යුද්ධය පුපුරා යාමට තුඩු දුන් ධනවාදයේ අතිමූලික පරස්පර විරෝධයන්ගේ ම නිෂ්පාදිතයකි. 1914 සහ 1918 අතර සිව් වසරක් තුල සිදුවූ මනුෂ්‍ය සංහාරයෙන් ජාතික සතුරුකම් හෝ ආර්ථික උභතෝකෝටිකයන් කිසිවක් නොවිඳුනු අතර යම් තම් දශක දෙකක් ගතවෙද්දී දෙවන ගෝලීය ගැටුමකට තල්ලු වී ගියේ ය. අඩුම වශයෙන් දශ ලක්ෂ හැත්තෑවක් මහජනයා සත්‍යානය කිරීම ඇතුලුව විස්තර කල නොහැකි ම්ලේච්ඡත්වයකට තුඩු දුන්නේ ය.

මෙම ගැටුමට තුඩු දුන් කොන්දේසි කෙදිනක වත් යලි මතු නොවනු ඇතැයි යන අදහසක් ලාබ පද්ධතියේ ක්ෂමාලාපකයෝ දෙවන ලෝක යුද්ධයෙන් පසුව පවත්වාගෙන ගියහ. එහෙත් පසුගිය මාස දොලහ ඇතුලත වසර හැත්තෑපහක් තුල දී ගෝලීය ආර්ථිකය බරපතල බිඳවැටීමකට මුහුන දී ඇති තතු තුල ධනවාදයේ ආරක්ෂකයන් පවා තුන්වන ලෝක යුද්ධයක අන්තරායන් ගැන පෙන්නුම් කරනු ලැබ ඇත. 2001න් පසුව දැනට මත් ඇමරිකානු අධිරාජ්‍යවාදය ඉරාකය සහ ඇෆ්ගනිස්ථානය ආක්‍රමනය කොට වාඩිලා ගෙන ඇති අතර ඉරානයට එරෙහි මිලිටරි ප්‍රහාරයක් සූදානම් කරමින් සිටී.

සසප සහ සසජාශි රැස්වීමේ දී දෙවන ලෝක යුද්ධයේ තීරනාත්මක ඓතිහාසික පාඩම් ගැන සාකච්ඡා කරනු ඇත. එම බියකරු යුද ගින්න අනිවාර්ය නොවී ය. ලෝක ධනවාදයේ අර්බුදයට තමන්ගේම විප්ලවවාදී සහ ප්‍රගතිශීලී විසඳුමක් ඉදිරිපත් කිරීමෙන් කම්කරු පන්තිය යලියලිත් වලකා ලීමේ සහ එකම "විසඳුම" යුද්ධය ලෙස සලකා ඊට ඉඩ හැරීම මගින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සහ ස්ටැලින්වාදය ඉටු කල ද්‍රෝහී භූමිකාවේ ප්‍රතිපලයකි.

සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රධාන ලේකම් සහ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික විජේ ඩයස් ප්‍රධාන වාර්තාව ඉදිරිපත් කරනු ඇත. ඉන් අනතුරුව ප්‍රශ්න සහ සාකච්ඡාව සඳහා අවස්ථාව ලබා දෙනු ඇත. ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන්ට සහ යුද්ධයට සහ මිලිටරිවාදයට විරුද්ධ වන සියලු දෙනාට මෙම රැස්වීමට සහභාගිවන ලෙස අපි ආරාධනය කරමු.

**ස්ථානය: මහජන පුස්තකාල ශ්‍රවනාගාරය, කොලඹ 7**

**දිනය සහ වේලාව: නොවැම්බර් 10 අඟහරුවාදා සවස 4.00 ට**

© www.wsws.org